# දැන්වීමයි

## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ස්ථානභාර නිලධාරී (ගබඩා/අලෙවි මධ්‍යස්ථාන) - කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණය (MA 1-1) - තනතුරු 01 -

(දීප ව්‍යාප්තව පවතින ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අලෙවි සැල් සහ ගබඩා සඳහා අනුයුක්ත කරනු ලැබේ)

MA 1-1 - 27910-10 × 300 – 7 × 350-4 × 495- 20 × 660 - 48 540/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

(2021.01.01) දිනට හිමි ආරම්භක වැටුප - රු.27,910 /-

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (අනිවාර්ය පොදු සුදුසුකම්)**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii . ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්යභාරය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්)

යන විෂයන් ඇතුළුව විෂයන් (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත් වී තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

සහ

(පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදාල අවස්ථාවන්හි දී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක.)

**(ඇ) තනතුරට අදාළ විශේෂිත වෙනත් සුදුසුකම් :**

ස්ථානභාර නිලධාරී ( අලෙවි මධ්‍යස්ථාන ) – අලෙවිකරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම සහ අලෙවිකරණය පිළිබඳ පිළිගත් ආයතනයක වසරක පළපුරුද්දක් තිබීම.

ස්ථානභාර නිලධාරී ( ගබඩා) – රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගබඩාකරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම සහ පිළිගත් ආයතනයක අදළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පිය නොවන, අර්ධ ශිල්පිය සහ ශිල්පිය සේවා ගණයෙහි පහත "ආ" "ඇ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii . ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්යභාරය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්)

යන විෂයන් ඇතුළුව විෂයන් (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් හය (06) කින් සමත් වී තිබීම.

(ඇ) සේවයේ ස්ථිර පත්වීම දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමකට යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය

**සටහන් :**

යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් ඉහත" ඉ" ඡේදයේ සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම් සේවා කාලපරිච්ඡේද ඉහත "ඉ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

**වයස :**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 02. ස්ථානභාර නිලධාරී (ඔසුළයන්) - කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණය (MA 1-1) - තනතුරු 01

MA 1-1 - 27910-10 × 300 – 7 × 350-4 × 495- 20 × 660 - 48 540/- (රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත)

(2021.01.01) දිනට හිමි ආරම්භක වැටුප - රු.27,910 /-

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (අනිවාර්ය පොදු සුදුසුකම්)**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්යභාරය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්)

යන විෂයන් ඇතුළුව විෂයන් (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත් වී තිබීම.

(ආ) අධ්‍යනයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

සහ

(පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදාල අවස්ථාවන්හි දී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක.)

**තනතුරට අදාළ විශේෂිත වෙනත් සුදුසුකම් :**

කෘෂිකර්මය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම (උසස් පෙළ කෘෂි විද්‍යා අංශයෙන් සමත් අයට අදාළ නොවේ.)

**වයස**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

### 03. ජංගම අලෙවි සහකාර - කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණය (MA 1-1) - තනතුරු 01

MA 1-1 - 27910-10 ×300 – 7× 350-4 × 495- 20 × 660 - 48 540/- (රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත. )

(2021.01.01) දිනට හිමි ආරම්භක වැටුප - රු.27,910 /-

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (අනිවාර්ය පොදු සුදුසුකම්)**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේදී

i සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්යභාරය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්)

යන විෂයන් ඇතුළුව විෂයන් (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්වී තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

සහ

(පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදාල අවස්ථාවන්හි දී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක.)

**තනතුරට අදාළ විශේෂිත වෙනත් සුදුසුකම් :**

අලෙවිකරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම සහ අලෙවිකරණය පිළිබඳ පිළිගත් ආයතනයක වසරක පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පිය නොවන, අර්ධ ශිල්පිය සහ ශිල්පිය සේවා ගණයෙහි පහත "ආ" "ඇ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii; ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්යභාරය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්)

යන විෂයන් ඇතුළුව විෂයන් (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් හය (06) කින් සමත් වී තිබීම.

(ඇ) සේවයේ ස්ථිර පත්වීම දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමකට යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය

**සටහන් :**

යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් ඉහත" ඉ" ඡේදයේ සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම් සේවා කාලපරිච්ඡේද ඉහත "ඉ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

**වයස :**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 04. යන්ත්‍ර ක්‍රියාකරු - ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණය (PL 2) - තනතුරු 03

PL -2 - 25750-10 ×270– 10× 300-10 × 330- 12 × 350 - 38 950/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

(2021.01.01) දිනට හිමි ආරම්භක වැටුප - රු. 25,750

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් යන්ත්‍ර හා යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාව (N.V.Q.) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. අදළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතාව (N.V.Q.) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්.
2. තනතුරට අදළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස**

අවුරුදු 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදළ නොවේ.

### 05. බොයිලර් ක්‍රියාකරු - ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණය (PL -2) - තනතුරු 01

PL -2 -25750-10 × 270– 10 × 300-10× 330- 12× 350 - 38 950/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

(2021.01.01) දිනට හිමි ආරම්භක වැටුප - රු. 25,750 /-

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් බොයිලර් ක්‍රියාකරවීම පිළිබඳ නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාව (N.V.Q.) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. අදළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතාව (N.V.Q.) දෙවැනි (02)මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්.
2. තනතුරට අදළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) දෙවැනි (02)මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදළ නොවේ.

**වෙනත්**

**සෑම අයදුම්කරුවෙකුම ,**

a ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

b. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

c. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය**

පත්වීම් බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවා ගනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදලට පත්වීම් ලාභීන් 8% ක් ද සේවා යෝජකයාගෙන් 12% ක් වශයෙන් දායක මුදල් ගෙවිය යුතුය. ඊට අමතරව සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට පත්වීම්ලාභියාගේ වැටුපෙන් 3% ට සමාන මුදලක් ගෙවනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් යොමු කළ යුතුය. අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ජීවදත්ත සහ අදළ සහතිකවල, සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් **සභාපති, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, නො: 94, පරණ කොට්ටාව පාර, නාවින්න මහරගම** යන ලිපිනයට 2021.07.31දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ sladcvacancies@gmail.com යන ඊමේල් ලිපිනයට එවිය යුතුය. ඔබගේ දුරකථන අංකය සහ ඔබ ගැන විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ලිපිනයන් සහ දුරකථන අංකයන් අයදුම්පතෙහි සඳහන් කර තිබිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ කෙළවරේ සහ ඊමේල් පණිවුඩයේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තැපෑලෙන් අස්ථානගතවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳ අප සංස්ථාව වගකියනු නොලැබේ.

**සභාපති**
**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**